# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.09 පැය 1320 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2793/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**මුදල් වංචා කිරීමක් සම්බන්ධයෙන් අවශ්‍ය කරන සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම සඳහා මහජන සහය පැතීම.**




ජයන්තිපුර, පොලොන්නරුව ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු කළුතර දකුණ පොලිස් ස්ථානය වෙත පැමිණ තමා, 2025.08.19 වන දින කළුතර නගරයේ පිහිටි බැංකුවක ATM යන්ත්‍රයෙන් මුදල් ලබා ගැනීම සඳහා පැමිණි බවත්, එහි සිටි තමා නොහඳුනන පුද්ගලයෙකුගෙන් සහාය ලබා ගත් බවත්, එම අවස්ථාවේදී එම පුද්ගලයාට තමාගේ ATM කාඩ්පත හා මුරපදය ලබා දුන් බවටත් එහිදී එම අය විසින් වෙනත් ATM කාඩ්පතක් තමාට ලබා දී පිටව ගොස් පසුව, තමාගේ ATM කාඩ්පත භාවිතා කරමින් රුපියල් ලක්ෂ 02 ක මුදලක් ලබා ගෙන ඇති බවටත් පවසමින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

තවද, මෙම සැකකරු මීට පෙරත් මේ ආකාරයෙන්ම මුදල් වංචා සිදුකිරීම සම්බන්ධයෙන් කළුතර දකුණ පොලිස් ස්ථානය හා වාද්දුව පොලිස් ස්ථානයට මෙවැනි පැමිණිලි 04 ක් වාර්තා වී ඇති අතර මෙම සැකකරු දිවයිනේ විවිධ ස්ථාන වලට ගමන් කරමින් නිරන්තරයෙන් මෙවැනි වංචා රැසක් සිදු කරන අයෙකු බවටත් දැනට සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත.

ඒ අනුව, සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා එම බැංකුවෙහි සීසීටීවී දර්ශන වලින් ලබා ගන්නා ලද වීඩියෝ පටයක් ඔබ මාධ්‍ය වෙත යොමු කරන අතර, එහි සිටින සැකකරු සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම් දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**දුරකථන අංක -**

- **මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක කළුතර දකුණ - 071 – 8591691**
- **ස්ථානාධිපති අපරාධ අංශය කළුතර දකුණ - 071 - 8594360**

මහජනතාවගේ දැනගැනීම සඳහා ඉහත නිවේදනය සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය ආයතනය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**